# ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

## නව ලොව සුවිශේෂී නව රැකියා සඳහා
## සංචාරක කර්මාන්තයට අදම පිවිසෙන්න.



# ජාතික සංචාරක මාර්ගෝපදේශක පාඨමාලාව
## (ඉංග්‍රීසි / ඉංග්‍රීසි හැර අනෙකුත් විදේශ භාෂා)

1. **ඇතුළත් වීම සඳහා සැපිරිය යුතු සුදුසුකම්**

   I. අයදුම්කරු ශ්‍රී ලාංකීක පුරවැසියකු විය යුතු ය.

   II. අයදුම්කරුගේ වයස ඉල්ලුම්පත් යොමු කළ යුතු අවසන් දිනය යෙදෙන දිනට අවුරුදු 21ත් 60 ත් අතර විය යුතු ය.

   III. අ.පො.ස (උ /පෙළ )විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක් තුළ සියලු විෂයන් එක් වරකදී සමත්ව තිබිය යුතු වීම.

   සහ

   අ. පො. ස. ( සා/පෙළ) ඉංග්‍රීසි විෂය සම්මාන සාමාර්ථයක් සහිතව සමත්වීම.

   (ජාතික සංචාරක මාර්ගෝපදේශක පාඨමාලාව - ඉංග්‍රීසි භාෂාව සඳහා පමණයි)

   හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාල උපාධියක් ලබා තිබිය යුතුය.

   IV. සංචාරක මාර්ගෝපදේශකයෙකු ලෙස ක්‍රියා කිරීමට බලාපොරොත්තු වන්නා වූ භාෂාව සඳහා පිළිගත් ආයතනයක් මඟින් නිකුත් කරන ලද, භාෂා ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතු ය.

   හෝ

   එකී භාෂාව, මව් භාෂාව වන රටක අවම වශයෙන් වසර 05 ක් වාසය කිරීම හා වෘත්තියක නියැලීම සහ එම කරුනු සනාථ කිරීමට අදාළ සහතික ඉදිරිපත් කළ යුතු ය. (ජාතික සංචාරක මාර්ගෝපදේශක පාඨමාලාව ඉංග්‍රීසි හැර අනෙකුත් විදේශ භාෂා සඳහා පමණයි )

2. **විශේෂ සුදුසුකම් හා නිර්ණායක:**
   - බලපත්‍රලාභි රියදුරු සංචාරක මාර්ගෝපදේශකවරයෙකු ලෙස වසර 05 ක අඛණ්ඩ සේවා පළපුරුද්දක් තිබීම.

   හෝ
   - NVQ 04 මට්ටම සහිත සංචාරක මාර්ගෝපදේශ වැඩසටහනක් සම්පූර්ණ කර තිබීම.

   හෝ
   - බලපත්‍රලාභි ප්‍රාදේශීය සංචාරක මාර්ගෝපදේශකවරයෙකු ලෙස වසර 08 ක අඛණ්ඩ සේවා පළපුරුද්දක් තිබීම.

3. **පාඨමාලා කාලය :**

   මාස 05 (පූර්ණ කාලීන)

4. **පාඨමාලා ගාස්තුව :**

   රු.150,000.00

   ලියාපදිංචි ගාස්තුව - රු 1000/= විභාග ගාස්තුව - රු. 1000/=

5. **පාඨමාලාව පවත්වන ස්ථානය :**

   කොළඹ පාසල

**අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය**
**මාර්තු 02 දින 2025**

6. **අයදුම් කළ යුතු ආකාරය :**

   www.slithm.edu.lk වෙබ් අඩවිය මගින් මාර්ගගත ක්‍රමයට අයදුම්පතක් යොමු කරන්න. පාඨමාලාව සඳහා අයදුම්පත් ගාස්තුව ලෙස රු. 500ක මුදලක් අය කෙරේ. පහත ගිණුම් අංකයට අයදුම්පත් ගාස්තුව බැර කර ලදුපත උඩුගත කරන්න. (BOC ආයතනික ශාඛාව - 0007120156) වැඩි විස්තර සඳහා www.slithm.edu.lk වෙබ් අඩවිය බලන්න.

7. **තෝරා ගැනීමේ ක්‍රියාවලිය :**

   අයදුම්කරුවන් ආයතනය මගින් පවත්වන ලිඛිත පරීක්ෂණය, භාෂා පරීක්ෂණය සහ සම්මුඛ පරීක්ෂණය සඳහා මුහුණ දිය යුතුය.

8. **වෙනත් තොරතුරු :**

   ඔබගේ අයදුම්පත සාර්ථකව යොමු කළ විට ඒ බව ඊමේල් පණිවිඩයක් මගින් දැනුවත් කරන අතර ඉදිරි පියවරයන් හිදී ඊමේල් මගින් පමණක් ඔබව දැනුවත් කරනු ඇත.

**යම් අයදුම්කරුවකු වෙනුවෙන් ආයතනය වෙත සිදු කෙරෙන සියලු ආකාරයේ බලපෑම් පාඨමාලාව හැදෑරීම සඳහා නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.**

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය,
නො. 78, ගාලු පාර, කොළඹ 03.
වෙබ් අඩවිය : www.slithm.edu.lk විමසීම් :011-2208312